එවැනි දෙමව්පියන්/භාරකරුවන්/ගුරුවරුන් සඳහා, තරඟකරුවන් නවාතැන් ලබන ස්ථානයෙහිම (SLIDA) ඉතා සීමිත නවාතැන් ගණනක් සපයා දිය හැකිය. එය කලින් අයදුම් කරන අය සඳහා ප්‍රමුඛතාවය හිමි වේ. එම දෙමව්පියන්/භාරකරුවන්/ගුරුවරුන් ලබාගන්නා නවාතැන් හා ආහාරපාන සඳහා සහනදායී ගාස්තුවක් SLIDA ආයතනය විසින් අයකරනු ඇත.

## ප්‍රවාහන පහසුකම් ලබා දෙනවාද?

► අගෝස්තු 07 දින පෙ.ව. 8.00ට නවාතැන් ගන්නා (SLIDA) ආයතනයේ සිට ඩයලොග් ආයතන දක්වා ප්‍රවාහන පහසුකම් සපයන අතර, එදින වැඩමුළුව අවසන් වූ පසු, නැවත SLIDA ආයතනය වෙත ප්‍රවාහන පහසුකම් ලබා දෙනු ඇත.

මෙම පුහුණු කඳවුර සඳහා තරඟකරුවන්ගේ නිවෙස්වල සිට පුහුණු ස්ථානයට පැමිණීමට හෝ ආපසු යාමට ප්‍රවාහන පහසුකම් ලබා දීමක් හෝ ඒ සඳහා පිරිවැය පියවීමක් SPARK තරඟ සංවිධායකයන් විසින් සිදු නොකෙරේ. තරඟකරුවන් අගෝස්තු 06 දින නවාතැ-න් ගැනීමට අපේක්ෂා කරන්නේනම් SLIDA ආයතනය වෙත පැමිණීමට හෝ අගෝස්තු 07 දින පුහුණුව සඳහා කෙළින්ම ඩයලොග් ආයතනයට පැමිණීමට (පෙ.ව. 8:30 වනවිට පැමිණ සිටිය යුතුය) සහ අගෝස්තු 08 දින පුහුණු කඳවුර අවසන් වූ පසු ආපසු නිවෙස් වෙත යාමට ප්‍රවාහන පහසුකම් තරඟකරුවන් විසින් සපයා ගත යුතුය.

## පුහුණු කඳවුර සඳහා රැගෙන ආ යුතු දේ මොනවාද?

► සෑම තරඟකරුවෙක්ම/කණ්ඩායමක්ම තම තරඟ අයදුම්පත්වල(ව්‍යවසායක සංකල්පය හා ව්‍යාපාරික සැලැස්ම) මුද්‍රිත පිටපතක් ද, තම ජාතික හැඳුනුම්පත හෝ (එය නොමැති නම්) උප්පැන්න සහතිකය ද රැගෙන ආ යුතුය.

► ඔබට අවශ්‍ය (දින 2ක් හා රාත්‍රී 2ක් සඳහා ප්‍රමාණ-වත් වන පරිදි) ඇඳුම්, බෙහෙත් (අවශ්‍ය වේ නම්) හා පෞද්ගලික ද්‍රව්‍ය (සබන්, තුවා, දත්බුරුසු හා දන්තාලේප ඇතුළු) රැගෙන ආ යුතුය.

► පුහුණු කඳවුරු කාලසීමාව තුළ ඊට ගැලපෙන ආකාරයේ ඇඳුම්වලින් (Smart casual) සැරසී සිටිය යුතුය.

## පුහුණු කඳවුර පවත්වන භාෂා මාධ්‍යය කුමක්ද?

► මෙම පුහුණු කඳවුර සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම සංවිධානය කරනු ලබයි.

► දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදු කරන අතර, සිංහල හා දමිළ මාධ්‍ය පරිවර්තන ඒ අවස්ථාවේදීම පළපුරුදු පුහුණුකරුවන් විසින් සිදුකරනු ඇත.

► තරඟකරුවන්ට තමන් කැමැති භාෂා මාධ්‍යයක් (සිංහල/ දමිළ/ ඉංග්‍රීසි) භාවිතා කළ හැකිය.

## පුහුණු කඳවුර සඳහා එක් දිනක් පමණක් සහභාගි විය හැකිද?

ඉහත වැඩසටහන් විස්තරයෙහි සඳහන් පරිදි, අගෝස්තු 07 හා 08 දින දෙකෙහිම මෙම පුහුණු කඳවුරෙහි සෑම වැඩමුළු-වක් සඳහාම ඔබ සහභාගි වීම අත්‍යාවශ්‍ය වේ.
මෙම පුහුණු කඳවුර සඳහා සහභාගි නොවීම SPARK තරඟාවලියෙහි ඉදිරියට යාමට නුසුදුසුකමක් ලෙස සැලකේ. (ඉතාමත් නොවැලැක්විය හැකි හේතු මත ඇතිවන විශේෂිත අවස්ථා සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු කරන අතර, ඒ පිළිබඳ අවසාන තීරණය කිරීමේ බලය SPARK තරඟ සංවිධායකයන් සතු වේ.)

## වැඩිදුර තොරතුරු හා විමසීම සඳහා ඇමතිය හැකි කාවද?

ඒ සඳහා අමතන්න:
උපේක්ෂා මිය (0740880485) - ඉංග්‍රීසි/සිංහල මාධ්‍ය
රවී මයා (0773395295) - ඉංග්‍රීසි/දමිළ මාධ්‍ය

පුහුණු කඳවුර පවත්වෙන ස්ථානය:
ඩයලොග් ආසියාටා (Dialog Axiata)
ආයතනයේ ශ්‍රවණාගාරය,
යුනියන් පෙදෙස, කොළඹ 07

නවාතැන් පහසුකම් සපයන ස්ථානය:
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන (SLIDA)
ආයතනය, මලලසේකර මාවත, කොළඹ 07
(BMICH අසල)

## SPARK වැදගත් වන්නේ ඇයි?

ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතරින් ව්‍යවසායකත්වය තමාට සුදුසු වෘත්තීය ක්ෂේත්‍රයක් ලෙස සලකනුයේ 30% කට අඩු ප්‍රමාණයකි. මේ හේතුවෙන්, පවතින අවස්ථාවන්ගේ ඵල ප්‍රයෝජන ලබාගැනීමට දිරිගැන්වීමක් ලෙස නොව, හුදෙක් වෙනත් විකල්පයක් නොමැති වූ විට තෝරාගැනීමට බල කෙරෙන අවසන් විකල්පය බවට ව්‍යවසායකත්වය පත්ව ඇත.

දකුණු ආසියානු ව්‍යවසායකත්ව නායකත්ව වැඩසටහන යටතේ, SPARK තරඟාවලිය වැනි ක්‍රියාමාර්ග මගින්, තරුණ ප්‍රජාව ව්‍යවසායකත්ව ලෝකයට යොමුවීම දිරිගැන්වීමටත්, ඒ සඳහා සුදුසු ව්‍යවසායක වාතාවරණයක් නිර්මාණය කිරීමත් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අරමුණු වේ.

නව රැකියා උත්පාදනය හා සුනිසි රැකියා අවස්ථා බිහිකිරීමට අමතරව, පවතින තත්ත්වය වෙනස් කරමින්, නව්‍ය සංකල්ප යෙදවීමටද, සමාජ ගැටළු සඳහා විසඳුම් ඉදිරිපත් වීමටද, අඛණ්ඩ ප්‍රගතිය කරා ඉදිරියට යාමටද ව්‍යවසායකත්වය මගින් අවස්ථා උදා වේ. ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකාව නව මාර්ග ගවේෂණය කරමින් සිටින වර්තමානයේ මෙවැනි අවස්ථා ඉතා වැදගත් වේ. තරුණ තරුණියන්ගේ නිර්මාණාත්මකබව, ඉදිරිගාමී චින්තනය හා කුසලතා ඒකා-බද්ධ කර ගනිමින්, 2030 තිරසර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට එය උපකාරී වනු ඇත.



SPARK තරුණ ව්‍යවසායකත්ව තරඟාවලිය
2023

# SPARK

පුහුණු කඳවුර (Bootcamp) 2023
අගෝස්තු 6 සිට 8 දින දක්වා

**SPARK** තරඟාවලියෙහි තෙවන වටයට තේරී පත් වෙමින්, ව්‍යවසායකත්ව පුහුණු කඳවුර සඳහා තෝරාගත් තරඟකරුවන්/කණ්ඩායම් 30 අතරට ඔබ පත් වී ඇති බව සතුටින් දන්වමු. මෙම තරඟය සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් 400කට අධික සංඛ්‍යාවෙන් මේ දක්වා ඉදිරියට පැමිණීමට ඔබට හැකිවීම පිළිබඳ ව අපගේ උණුසුම් සුභපැතුම්!

**SPARK** තරඟාවලිය, ඔබගේ නව්‍ය ව්‍යවසායකත්ව සංකල්පය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබාදෙන තෝතැන්න යි, **SPARK** තරඟාවලිය සහ පුහුණු කඳවුර (bootcamp) පිළිබඳ ඔබ දැනගතයුතු කරුණු සියල්ල ම මෙයින් ඉදිරිපත් කරමු.

## SPARK යනු කුමක්ද?

ශ්‍රී ලාංකේය ව්‍යවසායකත්වයේ ඉදිරි පරපුර සඳහා වන ජාතික තරඟාවලිය යි!
වර්තමානයේ අප ඉදිරියේ පවතින අභියෝගවලට සිය නවෝත්පාදන සංකල්ප හා ව්‍යවසායකත්ව විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා වයස අවුරුදු 15ත් 24ත් අතර වන තරුණ නිර්මාණකරුවන්, විප්ලවීය චින්තකයන්, ගැටළු විසඳන්නන් හා නවෝත්පාදකයන් වෙත අප මෙයින් ආරාධනා කළෙමු. එසේම, තරුණ ප්‍රජාව අතර, ව්‍යවසායකත්වය වඩාත් ඵලදායී වෘත්තීය තෝරාගැනීමක් බවට පත් කිරීමට අවශ්‍ය දිරි ගැන්වීම ලබා දීමත්, ව්‍යවසායකත්ව ගමන්මග ඉදිරි පියවර සඳහා එම තරුණ තරුණියන් සවිබල ගැන්වීමත් SPARK තරඟාවලිය මගින් අරමුණු කෙරේ.

## SPARK සංවිධානය කරන්නේ කවුද?

ලංකා වාණිජ මණ්ඩලය විසින් **SPARK** තරඟාවලිය සංවිධානය කරන අතර, ඒ සඳහා පූර්ණ දායකත්වය, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහය සහිත ව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ක්‍රියාත්මක කරන දකුණු ආසියානු ව්‍යවසායකත්ව නායකත්ව (**SALE**) වැඩසටහන වෙතින් ලබා දෙයි. තවද, මෙම තරඟාවලිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (**UNDP Citralab**), ඩයලොග් ආයතනය (**Dialog ideamart & IMED**, **CurveUp**, **SquareHub**, **AIESEC and CDEA** යනාදී ආයතන ගණනාවක සහාය හිමි වී ඇත.

## තරඟාවලියට සහභාගිවන්නන් හා ජයග්‍රාහකයන්ට හිමි වන්නේ කුමක්ද?

- අධ්‍යාපන වැඩමුළු හා පුහුණු සැසි මගින් ඔබේ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා අවස්ථා
- ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විශේෂඥයන් වෙතින් උපදෙස් ලබාගැනීමට සම්මුඛ සාකච්ඡා
- සුදුසු ආයෝජකයන් හා හවුල්කරුවන් හමුවීමට හා සබඳතා වර්ධනය කරගැනීමේ අවස්ථා
- SPARK තරුණ ව්‍යවසායකත්ව තරඟාවලිය - 2023 ජය සම්මාන දිනා ගැනීමේ අවස්ථා
- තරඟ ජයග්‍රාහකයන්ට හිමිවන විදේශ අධ්‍යයන සංචාර අවස්ථා

## SPARK පුහුණු කඳවුර (bootcamp) යනු කුමක්ද?

තෙවන වටයට තෝරාගත් තරඟකරුවන්/කණ්ඩායම් 30 සඳහා සංවිධානය කරන මෙම දෙදින නේවාසික වැඩමුළුව මගින්, ඔබේ ව්‍යවසායකත්ව, නායකත්ව හා සන්නිවේදන නිපුණතා වර්ධනය කර ගැනීමට වඩාත් පුළුල් පුහුණු හා අධ්‍යයන පරිසරයක් මෙන්ම, පළපුරුදු පුහුණුකරුවන් වෙතින් උපදේශනය ලබාගැනීමට ද අවස්ථා සලසා දෙනු ඇත.

## SPARK පුහුණු කඳවුර (bootcamp) අරමුණු මොනවාද?

- තරඟකරුවන් දිරිමත් කිරීම, උනන්දු කරවීම හා සවිබල ගැන්වීම
- සිය ව්‍යවසායක සංකල්ප වඩාත් ශක්තිමත්ව හා විශ්වාසනීයව ඉදිරිපත්කිරීමට තරඟකරුවන්ගේ නිපුණතා වර්ධනය කිරීම
- තරඟකරුවන්ගේ සන්නිවේදන, ප්‍රකාශන, සාමූහිකත්ව, විශ්ලේෂණාත්මක චින්තන හා කාල කළමනාකරණ කුසලතා දියුණු කරගැනීම සඳහා අවස්ථා සැලසීම
- පුහුණුකරුවන්, එක් එක් ක්ෂේත්‍රයන්හි ප්‍රවීණ ව්‍යවසායකයන් හා SPARK හවුල්කරුවන් හමුවීමට හා එයින් දැනුම වර්ධනය කරගැනීමට අවස්ථා ලබා දීම

මම නේවාසික පුහුණු වැඩමුළුව තුළින්, තරඟකරුවන් හට ඉහළ නිපුණතාවයකින් හා ආත්ම විශ්වාසයකින් යුතුව, ඉදිරියේ දී පැවැත්වෙන මාර්ගගත ඉදිරිපත් කිරීම් මගින් SPARK අවසාන මහා තරඟය සඳහා තේරී පත්වන 10 දෙනා අතරට තරඟ කිරීමේ හැකියාවක් ලබාගත හැකිවනු ඇත.

එසේම, ඔබ වැනි වූ අනාගත තරුණ ව්‍යවසායකයන් හා පුහුණුකරුවන් හමුවීමටද, අදහස් හා අත්දැකීම් හුවමාරු කර ගැනීමටද, ඔබගේ අනාගත ව්‍යවසායක ගමන්මග සැලසුම් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා සහාය ලබා ගැනීමටද මෙය මහගු අවස්ථාවක් වනු ඇත.

## SPARK පුහුණු කඳවුර (bootcamp) වැඩසටහන

| ආරම්භක වේලාව | අවසන් වේලාව | වැඩ සටහන/පියවර |
|---|---|---|
| 2023 අගෝස්තු 06 දින | | |
| ප.ව. 05:00 | ප.ව. 07:00 | තරඟකරුවන් SLIDA ආයතනයට පැමිණීම |
| ප.ව. 07:00 | ප.ව. 08:00 | රාත්‍රී ආහාරය |
| ප.ව. 08:00 | ප.ව. 09:00 | සංස්කෘතික ප්‍රසංගය |
| | ප.ව. 09:00 | දිනයේ වැඩසටහන් නිමාව |
| 2023 අගෝස්තු 07 | | |
| පෙ.ව. 07:00 | පෙ.ව. 08:00 | උදේ ආහාරය (SLIDA ආයතනයේ දී) |
| පෙ.ව. 08:10 | | SLIDA ආයතනයෙන් පිටත්වීම |
| | පෙ.ව. 08:30 | Dialog ආයතනයට පැමිණීම |
| පෙ.ව. 08:30 | පෙ.ව. 09:00 | පිළිගැනීම හා ලියාපදිංචිය |
| පෙ.ව. 09:00 | පෙ.ව. 09:45 | සමාරම්භක උත්සවය |
| පෙ.ව. 09:45 | පෙ.ව. 10:30 | පුහුණු කඳවුර (පියවර 01) |
| පෙ.ව. 10:30 | පෙ.ව. 10:45 | තේ විවේකය |
| පෙ.ව. 10:45 | පෙ.ව. 11:15 | අභිප්‍රේරණ දේශනය 01 |
| පෙ.ව. 11:15 | ප.ව. 12:45 | පුහුණු කඳවුර (පියවර 02) |
| ප.ව. 12:45 | ප.ව. 01:45 | දිවා ආහාර විවේකය |
| ප.ව. 01:45 | ප.ව. 04:15 | පුහුණු කඳවුර (පියවර 03) |
| ප.ව. 04:15 | ප.ව. 04:30 | තේ විවේකය |
| ප.ව. 04:30 | ප.ව. 07:00 | පුහුණු කඳවුර (පියවර 04) |
| ප.ව. 07:00 | | Dialog ආයතනයෙන් පිටත්වීම |
| | ප.ව. 07:15 | SLIDA ආයතනයට පැමිණීම |
| ප.ව. 07:30 | ප.ව. 08:30 | රාත්‍රී ආහාරය |
| | ප.ව. 09:00 | දිනයේ වැඩසටහන් නිමාව |
| 2023 අගෝස්තු 08 | | |
| පෙ.ව. 07:00 | පෙ.ව. 08:00 | උදේ ආහාරය (SLIDA ආයතනයේ දී) |
| පෙ.ව. 08:00 | පෙ.ව. 10:30 | පුහුණු කඳවුර (පියවර 05)(SLIDA ආයතනයේ දී) |
| පෙ.ව. 10:30 | පෙ.ව. 10:45 | තේ විවේකය |
| පෙ.ව. 10:45 | පෙ.ව. 11:15 | පුහුණු කඳවුර (පියවර 06) |
| පෙ.ව. 11:15 | පෙ.ව. 11:45 | අභිප්‍රේරණ දේශනය 02 |
| පෙ.ව. 11:45 | ප.ව. 12:45 | පුහුණු සායනය(Mentoring Clinic) |
| ප.ව. 12:45 | ප.ව. 01:45 | දිවා ආහාර විවේකය |
| ප.ව. 01:45 | ප.ව. 03:00 | ප්‍රකාශන පුහුණුව (Pitch Craft Coaching) |
| ප.ව. 03:00 | ප.ව. 04:00 | වැඩමුළුව සමාප්ත කිරීමේ උත්සවය |

## වැඩිදුර තොරතුරු, නවාතැන් හා අනෙකුත් පරිපාලනමය තොරතුරු

### පුහුණු කඳවුර (bootcamp) පැවැත්වෙන්නේ කොතැනද?

- මෙම දෙදින පුහුණු කඳවුර කොළඹ දී පැවැත්වේ.
- පළමු දිනය (අගෝස්තු 07 දින) ස්ථානය: ඩයලොග් ආයතනයේ ශ්‍රවණාගාරය
- දෙවන දිනය (අගෝස්තු 08 දින) ස්ථානය: ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන (SLIDA) ආයතනය

### නවාතැන් හා ආහාරපාන ලබා දෙනවාද?

මෙම තරඟාවලියට දුරබැහැර සිට සහභාගි වන තරඟකරුවන් සඳහා, අගෝස්තු 06 හා 07 දෙදිනට නොමිලේ නවාතැන් පහසුකම් සැලසීමට (ඉදිරිපත්වන ඉල්ලීම් අනුව) කටයුතු කෙරේ. එම පහසුකම් ලබාගැනීමට අපේක්ෂා කරන අය, ඒ බව අගෝස්තු 4 දින හෝ ඊට පෙර පහත නම් සඳහන් නිලධාරීන් වෙත දැන්විය යුතුය:

**උපේක්ෂා මිය (0740880485) - ඉංග්‍රීසි/සිංහල මාධ්‍ය**
**රවී මයා (0773395295) - ඉංග්‍රීසි/දමිළ මාධ්‍යප**

පුහුණු කඳවුර පැවැත්වෙන ස්ථානයන්ට ආසන්නයේ පදිංචිව සිටින (හෝ දිනපතා ප්‍රවාහන පහසුකම් සලසාගත හැකි) තරඟකරුවන් මෙම නවාතැන් පහසුකම් සඳහා අයදුම් නොකරන ලෙස ඉල්ලා සිටිමු (එවැනි පහසුකම් අත්‍යාවශ්‍ය අයට එම අවස්ථා ලබාදීම සඳහාය)

පුහුණු කඳවුරට පෙර දින (අගෝස්තු 06) නවාතැන් ගන්නා අය සඳහා එදින රාත්‍රී ආහාරයද, පුහුණු කඳවුර පැවැත්වෙන අගෝස්තු 07 හා 08 දෙදින සියලු තරඟකරුවන් සඳහා ආහාරපාන ලබා දීමට කටයුතු යොදා ඇත.

### තරඟකරුවන් සමග දෙමව්පියන් හෝ ගුරුවරුන්ට පැමිණිය හැකිද?

ඔව්. වයස අවුරුදු 18ට අඩු තරඟකරුවන් හෝ කණ්ඩායම් සඳහා එක් අයෙක් පමණක් (මවක් හෝ පියෙක් හෝ භාරකරුවෙක්) පැමිණිය හැකිය. පාසල් තරඟකරුවන් සඳහා එක් මවක් හෝ පියෙක් හෝ ගුරුතුමෙක්/තුමියක් පැමිණිය හැකිය.